**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

**ஓய்வூதியத் திணைக்களம்**
**DEPARTMENT OF PENSIONS**

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය | தலைமுறையொன்றின் பெருமிதம் | Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. වි.වැ.ගි/53/2025/03

ඔබේ අංකය / உமது இல. / Your No. ..................................

දිනය / திகதி / Date 2025.03.10

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>නොගෙවූ විශ්‍රාම වැටුප් චෙක්පත් මඟින් ගෙන්වා ගැනීම.</u>**

නොගෙවූ විශ්‍රාම වැටුප්,විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත බැර කිරීම සඳහා නිකුත් කර ඇති PEN/ACC/43 අංක දරණ 2020.11.18 දිනැති ලිපිය හා බැඳේ.

02.කොවිඩ් වසංගත තත්වය පැවති සමයේදී රාජකාරි නිවසේ සිටම සිදු කරන ලදී. එහිදී විශ්‍රාමිකයින් වෙත වැඩිපුර ගෙවන ලද මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නැවත දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේදී කාල ප්‍රමාදයක් සිදුවීම මත මෙම මුදල් සෘජුව දෙපාර්තමේන්තු ගිණුම වෙත බැර කිරීම සඳහා උක්ත ලිපිය මඟින් බලය ලබාදෙන ලදී.එහෙත් එහි නියමයන් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම මත මේ වන විට දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම තුළ හඳුනා නොගත් තැන්පතු විශාල ප්‍රමාණයක් පවතී. මෙම ගැටළුව විසඳීම සඳහා උක්ත ලිපිය 2025.03.01 දින සිට බලපවත්වන පරිදි අවලංගු කරන බව කාරුණිකව දන්වමි.

03.ඒ අනුව විශ්‍රාමිකයින් මිය යාමෙන් පසු නැවත අයකර ගන්නා මුදල් හා දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන සියළුම මුදල් සෘජුව බැංකු ගිණුම වෙත බැර නොකර ආවරණ ලිපියක් සහිතව දෙපාර්තමේන්තුවට යොමුකළ යුතු බව කාරුණිකව දන්වමි.

04.එසේම අපගේ නිල බැංකු ගිණුම වෙත මුදල් සෘජුව බැර කරන ලෙස බැංකු වෙත ලිපි යොමු නොකළ යුතු අතර එම මුදල් ඔබ වෙත ගෙන්වා ගෙන අප වෙත ආවරණ ලිපියක් සහිතව යොමු කිරීමට කටයුතු කළ යුතු බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

Achini

වාමින්ද හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**මාළිගාවත්ත, කොළඹ 10.** மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.

Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk